# මග නොදුටු මාක්

මාක් විද්වතා ඉන්ද්‍රිය ගෝචර සංසිද්ධි පිළිබඳ අවධාරණයක් කෙළේ ය. ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප බටහිර භෞතික විද්‍යාවේ සංසිද්ධි තේරුම්කරදීම සඳහා යොදාගැනීම ඔහු ප්‍රතික්ෂෙප කෙළේ ය. එය ඔහුගේ හා වෙනත් අයගේ මූලිකත්වයෙන් වර්ධනය වූ ඉන්ද්‍රියානුභූතවාදයට (positivism) ද බලපෑවේ ය. එහෙත් ඔහු ඉන්ද්‍රිය ගෝචර සංසිද්ධි හා සංකල්ප පිළිගැනීමට මැලිකමක් නො දැක්වීය. මෙහි පදනමක් වේ ද?

ගුරුත්වාකර්ෂණ බලය, අවස්ථිති සමුද්දේශ රාමුව, පරමාණුව, නිරපේක්ෂ අවකාශය ආදිය නිරීක්ෂණය කළ හැකි දෑ නො වෙයි. එහෙත් පොල්ගෙඩියක් යනු නිරීක්ෂණය කළ හැකි දෙයක් වෙයි. නිරීක්ෂණය කළ හැකි පොල් ගෙඩිය හා නිරීක්ෂණය නොකළ හැකි පරමාණුව හෝ අවස්ථිති සමුද්දේශ රාමුව හෝ අතර ඇති වෙනස කුමක් ද?

මෙහි දී ප්‍රථමයෙන් ම කිවයුතු කරුණක් වෙයි. මාක් පඬිවරයා ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප මුළුමනින් ම ප්‍රතික්ෂෙප නො කෙළේ ය. ඔහු පරමාණුව ප්‍රතික්ෂෙප කෙළේ යැයි කිසිවකු විසින් හෝ වරදවා වටහාගනු ලැබිය යුතු නො වෙයි. ඔහු කියා සිටියේ ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප බටහිර භෞතික විද්‍යාවේ දී යොදා නොගත යුතු බව පමණ ය. එසේ ද වුවත් ඉන්ද්‍රියානුභූතවාදය වර්ධනය වී ඇති ආකාරය අනුව මෙය වෙනත් පැත්තකට ගොස් ඇත. ඉන්ද්‍රියානුභූතවාදීන්ට අවශ්‍ය වන්නේ ඊනියා ඇත්ත දැනුම කුමක් දැයි තේරුම්ගැනීම ය. එහි දී ඔවුහු ඉන්ද්‍රිය ගෝචර සංකල්ප ගැන වැඩි අවධාරණයක් කරති.

අර්නස්ට් මාක් පඬිවරයා කලින් ද සඳහන්කර ඇති අන්දමට ලංකාවේ ගාල්ලේ වැඩ විසූ භික්ෂුන් වහන්සේ නමක් සමග ලිපි හුවමාරුකරගෙන ඇත. එමෙන් ම එතුමා චර්යාවෙන් ද බෞද්ධයකු වූ බව කියැවෙයි. මේ බෞද්ධ ආභාසය ද එතුමාට තම ඥානවිභාගය (epistemology) හෙවත් දැනුම පිළිබඳ ප්‍රවාදය ගොඩනගා ගැනීමේ දී ඉවහල්වන්නට ඇතැයි සිතිය හැකි ය. එහෙත් බෞද්ධයනට මෙලෙස ඉන්ද්‍රිය ගෝචර හා ඉන්ද්‍රිය ගෝචර නොවන යනුවෙන් සංකල්ප වර්ග දෙකක් ඇතිකරගැනීමේ අවශ්‍යතාවක් වේ ද?

මෙහි දී තවත් කරුණක් පැහැදිලි කළ යුතු වෙයි. පරමාණුව හා නිරපේක්ෂ අවකාශය යන දෙකම ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප වුව ද ඒ අතර වෙනසක් ද වෙයි. පරමාණුව ඉන්ද්‍රිය ගෝචර නොවන්නේ අපේ ඉන්ද්‍රියන්ට එවැන්නක් තිබුණ ද එය ප්‍රත්‍යක්ෂයෙන් දත නොහැකි බැවින් ය. එනම් එවැන්නක් "තිබුණ" ද එය අපේ ඉන්ද්‍රියවලට හසු නො වෙයි. එහෙත් පරමාණුව හා සවිඥානික නිරීක්ෂකයාට එකට පැවතීමේ සංකල්පීය බාධාවක් නොමැත. සංකල්පීයව ගත්කල සවිඥානික නිරීක්ෂකයකු සිටින අතර ම පරමාණුවක් ද තිබිය හැකි ය. මෙහි දී පරමාණු තිබේ යැයි විශ්වාස කෙරෙයි.

එහෙත් නිරපේක්ෂ අවකාශය සම්බන්ධයෙන් තත්ත්වය කුමක් ද? නිරපේක්ෂ අවකාශය යනු ද්‍රව්‍ය විකිරණ ආදී කිසිවකගෙන් තොර වූ දෙයක් වෙයි. එවිට එහි නිරීක්ෂකයකු ද සිටිය නො හැකි ය. නිරීක්ෂකයා සිටි විගස නිරපේක්ෂ අවකාශය නැති වී යයි. වෙනත් වචනවලින් කියන්නේ නම් සවිඥානික නිරීක්ෂකයකුට හා නිරපේක්ෂ අවකාශයට එකට පැවතිය නො හැකිය. එසේ පවතින්නේ යැයි ගැනීම ම සංකල්පීය වරදක් වෙයි. පරමාණුව හා නිරපේක්ෂ අවකාශය යන දෙකම ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප වුව ද ඒ අතර ඇති මේ වැදගත් වෙනස අප තේරුම් ගතයුතු ය.

කෙසේ වෙතත් ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප යම් ආකාරයකට හෝ ප්‍රතික්ෂෙප කිරීමට මාක් විද්වතා පෙළඹීම බෞද්ධ ධර්මය නිවැරදි ව හඳුනාගැනීමෙන් සිදු වුවක් යැයි කිවහැකි නො වෙයි. ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප කිනම් මට්ටමකින් හෝ ප්‍රතික්ෂෙප කිරීමෙන් ඉන්ද්‍රිය ගෝචර සංකල්පවලට යම් වැදගත්බවක් හිමිකෙරෙයි. ඉන්ද්‍රිය ගෝචර සංකල්ප පවතින්නේ යැයි ද එහෙත් ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප නොපවතින්නේ යැයි ද ආකාරයේ හැඟීමක් ඉන්ද්‍රියානුභූතවාදී දර්ශනවල ප්‍රකාශ වෙයි.

© Prof. Nalin De Silva

මාක් විද්වතා කලින් ද සඳහන්කර ඇති ආකාරයෙන් ඕස්ට්‍රියාවේ ඉපදී එහි හැදුණු වැඩුණු තැනැත්තෙක් විය. ඔහුගේ වටාපිට සංස්කෘතිය ක්‍රිස්තියානි/කතෝලික සංස්කෘතියක් විය.ක්‍රිස්තියානි වේවා කතෝලික වේවා ඒ සංස්කෘතීන්වල යම් පැවැත්මක් අවධාරණය කෙරෙයි. එහි දෙවියන් වහන්සේ ඇත්තටම ඇතැයි විශ්වාස කෙරෙයි. එමෙන්ම ඉන්ද්‍රිය ගෝචර ලෝකය ද ඇත්තටම පවතින බව විශ්වාස කෙරෙයි. එපමණක් නොව ඉන්ද්‍රිය ගෝචර ලෝකය දෙවියන්වහන්සේගේ නිර්මානයක් යැයි ද සැලකෙයි. ක්‍රිස්තියානි කතෝලික සංස්කෘතීන්හි ඉන්ද්‍රිය ගෝචර දෑ මෙන් ම ඉන්ද්‍රිය ගෝචර නොවන දෑ ද පැවතිය හැකි ය.

ක්‍රිස්තියානි/කතෝලික සංස්කෘතියක හැදුණු වැඩුණු අර්නස්ට් මාක් විද්වතාට ප්‍රශ්නය වන්නට ඇත්තේ ඉන්දිය ගෝචර නොවන සංකල්පවල පැවැත්ම මිස පැවැත්ම යන්න නොවී යැයි සිතිය හැකි ය. ඉන්ද්‍රිය ගෝචර සංකල්පවල පැවැත්ම ඔහුට ප්‍රශ්නයක් නො වීය. අනෙක් අතට ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්පවල පැවැත්ම ද ඔහු එකහෙළා ප්‍රතික්ෂෙප නො කෙළේ ය. ඔහු කියා සිටියේ එවැනි සංකල්ප බටහිර භෞතික විද්‍යාවේ තේරුම්කිරීම්වලදී යොදා නොගත යුතු බව පමණ ය.

මෙහි දී ඔහුට බෞද්ධ ධර්මය බලපෑවේ කෙසේ ද? බුද දහමෙහි ප්‍රත්‍යක්‍ෂ ගැන කියැවෙයි. යමක් තේරුම් ගැනීමේ දී එය ප්‍රත්‍යක්‍ෂයෙන් කිරීමේ වැදගත්කම බුදු දහමෙහි ඉගැන්වෙයි. ප්‍රත්‍යක්‍ෂ යන්න ගැන ද බුදු දහමෙහි කියැවෙන්නේ බටහිර සංස්කෘතියෙහි කියැවෙන ආකාරයට නො වෙයි. සාමාන්‍ය ඉන්ද්‍රිය හැරුණු විට අභිඥාවෙන් ලබාගන්නා දැනුමක් ගැන ද බුදු දහමෙහි කියැවෙයි. අභිඥා පිලිබඳ ව මාක් විද්වතා කිනම් අදහසක් ඇතිකරගෙන තිබුණේ ද යන්න පැහැදිලි නැත.

බුදු දහමෙහි ප්‍රත්‍යක්‍ෂ ගැන කෙරෙන අවධාරණයෙන් මාක් පඬිවරයා නොමග යන්නට ඇතැයි සිතිය හැකි ය.ඇත්ත දැනුම කුමක් ද අප මනසින් ගොඩනගාගන්නා මනඃකල්පිත දැනුම කුමක් ද ආදී ප්‍රශ්න ගැන සිත යොමුකළ මාක් විද්වතාට බුදු දහමෙහි ප්‍රත්‍යක්‍ෂ ගැන කෙරෙන අවධාරණය යම් මතයකට ඒමට සඳහා ආධාරවන්නට ඇත. එසේ වුවත් ඉන්ද්‍රිය මගින් ලබන ප්‍රත්‍යක්‍ෂ හෝ අභිඥා ගැන හෝ බෞද්ධයන්, විශේෂයෙන් සිංහල බෞද්ධයන් දරණ ආකල්පය කුමක් ද?

අර්නස්ට් මාක් පඬිවරයාට මෙන් නොව සිංහල බෞද්ධයනට පැවැත්ම, එනම් ඇත්තටම පැවැත්ම යනුවෙන් සාමාන්‍යයෙන් කියැවෙන්න,  අහස පොළොව ගැටගසන ප්‍රශ්නයක් නො වෙයි. මේ පැවැත්ම යන ප්‍රශ්නය ම සිංහල බෞද්ධයනට නැත. මම යනුවෙන් කෙනකු, සත්ත්වයකු, පුද්ගලයකු ආදී වශයෙන් නැතැයි ගන්නා සිංහල බෞද්ධයනට පැවැත්ම ප්‍රශ්නයක් නො වෙයි. සිංහල බෞද්ධයාට පැවැත්ම ද මනස විසින් නිර්මාණය කෙරෙන්නකි. එවිට ඇතැම් පණ්ඩිතයන් නගන ප්‍රශ්නය වනුයේ එසේ නම් සියල්ල මනසේ නිර්මාණ ද යන්න ය. එයට ඔව් යැයි පිළිතුරු දුන් විගස මේ පණ්ඩිතයෝ බුදු දහම විඥානවාදී යැයි කෑ ගසති. එහෙත් ඔවුන් තේරුම් නොගන්නා දෙය නම් බුදු දහම විඥානවාදී ද නොවන බව ය. එයට හේතුව එහි මනසට ද පැවැත්මක් නො මැතිවීම ය.

මනස ද මනසේ ම නිර්මාණයක් වන කල මනසට අනෙක් දැයින් වෙන් වූ අමුතු පැවැත්මක් නැත. මනස මනසේ නිර්මාණයක් වන්නේ කෙසේ ද යන්න සිංහල බෞද්ධ මනස යන මැයෙන් දිවයින පුවත්පතෙහි පළ වූ ලිපියක විස්තර කෙරී ඇත. මනස ද ඇතුළු සියල්ල නිර්මානය කෙරෙන්නේ අවිද්‍යාව හේතුකොටගෙන ය. අවිද්‍යාව ඇතිවන්නේ ද මනසත් සමග ය. මේවා එකිනෙකින් ස්වායත්ත දෑ නො වෙයි. පටිච්ච සමුප්පදායෙහි චක්‍රයක් ලෙස කියැවෙන්නේ මේ කතාව ය. එගි සඳහන් දේ එකවිට එහෙත් එකිනෙකට සම්බන්ධ වී උපදින දෑ ය. එමෙන් ම සිංහල බෞද්ධයනට ඉන්ද්‍රිය ගෝචර හා ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප අතර වෙනසක් ද නැත. සියළු සංකල්ප මනසේ නිර්මාන වෙයි.

සිංහල බෞද්ධයනට මනස විසින් සංස්කරණය කෙරී ඇති සියල්ල සම්මුති දැනුම් වෙයි. ඒ පවතින්නේ සම්මුතියෙන් මිස පරමාර්ථ වශයෙන් නො වෙයි. සම්මුතියක් ඇත්තේ විඥානයක් සහිත සත්ත්වයනට ය. පරමාර්ථ වශයෙන් පැවැත්මක් නැති බැවින් යම් සංකල්පයක් ඉන්ද්‍රිය ගෝචර ද නැත් ද යන්න සොයා බැලීමට සිංහල බෞද්ධයනට අවශ්‍ය නො වෙයි. පණ්ඩිතයන්ගේ දැනගැනීම සඳහා කිවයුත්තේ ඒ ප්‍රකාශය ද සම්මුති ප්‍රකාශයක් පමණක් බව ය. එනම් පරමාර්ථ වශයෙන් යමක් නොමැති යැයි කීම ද පරමාර්ථයක් නොව සම්මුතියක් පමණක් බව ය.

© Prof. Nalin De Silva

මාක් විද්වතා තරමක් නොමග ගොස් ඇති බව පැහැදිලි ය. බුදු දහමෙහි ප්‍රත්‍යක්‍ෂය අවධාරණය කරන්නේ එහි ප්‍රත්‍යක්‍ෂය මෙන් ම එය පිටුපස ඇති ප්‍රවාද ද පරමාර්ථ වශයෙන් නොපවතින නමුත් ප්‍රත්‍යක්‍ෂය වඩා ගෝචර බැවින් ය. ප්‍රත්‍යක්‍ෂය පිටුපසින් ඇති ප්‍රවාද හා සංකල්ප ගැන සිත යෙදවීමට ගියහොත් තව තවත් පඹගාලක සිරවෙනු මිස ඉන් නිවන්මගට වන සෙතක් නැත. අවශ්‍ය වන්නේ සසරින් ගැලවීම මිස වෙනත් ප්‍රවාද ගැන සිත සිතා සිටීම නො වෙයි. මාක් පඬිවරයාට ප්‍රශ්නය වූයේ තම ක්‍රිස්තියානි/කතෝලික සංස්කෘතික පසුබිමෙන් ගැලවීමට නො හැකිවීම ය. එසේ ගැලවීම පහසු කටයුත්තක් නො වේ. ඔහුට පැවැත්ම පිළිබඳ ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරක් අවශ්‍ය විය. ඇතැම් දෑ නිශ්චිතව පරමාර්ථ වශයෙන් පවතින බව ඔහුගේ චින්තනයෙහි විය.

ඒ කෙසේ වෙතත් මෙයින් කියැවෙන්නේ සිංහල බෞද්ධයන් ප්‍රවාද නිර්මානයෙන් වැළකිය යුතු ය යන්න නො වෙයි. නිවන් දැකීමට ප්‍රවාද අනවශ්‍ය වුවත් ඇතැම්විට නිවනට බාධාවක් වුවත්, අප අපේ ප්‍රවාද නිර්මානය කළ යුතු ය. අපට ගැලවීමට ඇත්තේ සසරින් පමණක් නො වෙයි. බටහිර සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික යටත්විජිතවාදයෙන් ද අප ගැලවිය යුතු ය. එහි දී අප බටහිරයන්ගේ ප්‍රවාද පමණක් යොදාගන්නේ නම් අපට ගැලවීමක් නැත. මෙරට හා අනෙක් ආසියාතික හා අප්‍රිකානු රටවල බොහෝ දෙනකු තේරුම් නොගන්නා කරුණ ද එය වෙයි. මාක්ස්වාදය, පශ්චාත්නූතනවාදය හෝ බටහිර නිපදවන වෙනත් වාදයක් උපයෝගී කරගෙන අපේ ගැලවීමට කටයුතු කිරීම හාවා හඳ දකින්නා ආකාරයේ වැඩක් වෙයි. ඒ වාද ද අවසාන වශයෙන් සේවය කරන්නේ අඩුම තරමින් බටහිර සංස්කෘතික යටත්විජිතවාදය හෝ පවත්වාගෙන යෑමට ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva